# ගංගාරාමයේ නවම් මහා පෙරහැර : විකාශය සහ උරුමය පිළිබඳ ඓතිහාසික විමර්ශනයක්

දීපිකා උදයංගනී විජේතුංග[1]

## හැඳින්වීම

පුරාතන සමාජ සංස්කෘතීන් හි සිට නූතන සමාජ සංස්කෘතීන් දක්වා යම් යම් විපර්යාසයනට බඳුන් වෙමින් පැවතෙන උත්සව සම්ප්‍රදායයක් වශයෙන් හෝ පූජා විධි සම්ප්‍රදායයක් වශයෙන් ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ පෙරහර යන්න හඳුනා ගත හැකි ය. පෙරහර ආගමික අර්ථයකින් භාවිතයට පැමිණෙන්නට ඇත්තේ ශ්‍රී ලංකාවට බුදුදහම පැමිණීමත් සමගය. එහෙත් ප්‍රාග් බෞද්ධ යුගයේ පවා පෙරහර යන්න විවිධ අර්ථයන්ගෙන් භාවිතයට ලක්ව පැවති ආකාරය පිළිබඳව ඓතිහාසික මූලාශ්‍රයෝ සාක්ෂ්‍ය දරති (වජිර හිමි, 1983 : 317). පෙරහර යන්න පරිහාර යන ශබ්දයෙන් නිපන් පදයකි. එය පාලි ග්‍රන්ථයන් හි විවිධාකාර අර්ථයන්ගෙන් යෙදී තිබේ. පෙරහර යන ශබ්දය සත්කාරය පිරිවර යන අර්ථයෙන් යොදා ඇති බව සුමංගල ශබ්ද කෝෂයෙ හි සඳහන් ය (සුශ 2006 : 640). මෙම පදය පෙළට යාම, එකිනෙකා පසුපස යෑම යන අර්ථයන් හි නූතනයේ දී ව්‍යවහාරිත ය. මෙරට පැරණිතම ඓතිහාසික මූලාශ්‍රයයක් ලෙස සැලකෙන මහාවංසයෙ හි විවිධ තැන් හි පෙරහර පැවැත් වූ බවට සාධක දක්වෙයි. එහි විජය රජු පඬු රජුගේ දුව මහ පෙරහරින් අභිෂේක කළා යැයි සඳහන් ය ( මව vii පරි 72 ගාථා). ශ්‍රී ලංකාවට ජය ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම විස්තර කරන අවස්ථාව ද මෙයට නිදසුනකි (-එම- xix පරි 24 -39 ගාථා) එය සිංහල බෝධි වංශයෙහි ද සඳහන් ය (බලන්න සිබෝව 1970). සිංහල ධාතු වංශයෙහි විවිධ රජවරුන් විසින් ආගමික අර්ථයෙන් යුක්තව පෙරහර පැවැත් වූ බවට සාධක පවතියි. මාගම වාසය කළ මහානාග යුවරජතුමා මහාදේව නම් තෙරුන් වහන්සේ විසින් පුද පූජා පවත්වමින් පැවති බුදුන් වහන්සේගේ ලලාට ධාතුව තමා භාරයට ඉල්ලා සිටීමත් අනතුරුව එය මහත් හරසරින් ගෙනවිත් රජමාළිගයට නුදුරුව නව මහල් ප්‍රාසාදයක් තනවා එහි වැඩමවා පුද පූජා පැවැත් වූ බවත් එහි සඳහන් ය. එම වැඩමවීම මහ පෙරහරකින් සිදුකළ බව සඳහන් වෙයි (සිධාව 430-445). ගිරි නුවර පාලනය කරන ලද අභය රජතුමා සිය භාර්යාව වූ සෝමාදේවිය සිහිකොට තැනූ සෝම නුවර ඉදිකරන ලද දාගැබෙහි මිහිඳු නම් තෙර නමක් විසින් ලබාදුන් බුදුන් වහන්සේගේ දකුණු දළදාව මහත් වූ පෙරහරින් යුක්තව තැන්පත් කළ බව සඳහන් ය (-එම- 508-509). මේ සියලු තැන්හි පිරිවර යන අර්ථයෙන් මෙම පදය යොදා ඇති බව සිතිය හැකි ය. කෙසේ වෙතත් නූතනය වනවිට පෙරහර සත්කාරය, පරිවාරය, පෙළට යෑම,

1 ස්වාධීනපර්යේෂක, deepikawijetunge@gmail.com /deepika_wijetunge@yahoo.com

එකිනෙකා පසුපස යෑම ආදී විවිධ අර්ථයන්ගෙන් යුක්තව භාවිත වෙයි. කෙසේ වුව ද වර්තමානය වනවිට ශ්‍රී ලාංකේය සංස්කෘතියෙ හි පෙරහර යන්න සුවිශේෂ උත්සව සම්ප්‍රදායයක් හෝ සුවිශේෂ අවස්ථාවක් වශයෙන් හඳුනාගත හැකි ය.

පෙරහරක් පැවැත්වීමෙහි පරමාර්ථ කිහිපයක් හඳුනාගත හැකි ය. අතීතයේ සිටම පෙරහර මූලික වශයෙන් ම වර්ෂාව බලාපොරොත්තුවෙන් පවත්වා තිබේ. එය සමාජයීය පරමාර්ථයක් වශයෙන් සිදුකොට ඇති බව හඳුනාගත හැකි ය. එයට එක් ප්‍රධාන හේතුවක් ලෙස ඉදිරිපත් කළ හැකි සාධකයක් නම් ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් ලෙස ස්ථාපිත වීමයි. ජලය සහ පස යන මූලික අංගයන් දෙක පදනම් කරගනිමින් ආර්ථිකය සක්‍රීය වන ආකාරයත්, ඒ සඳහා රජවරුන්ගේ අනුග්‍රහය ලබාදීමත් අතීතයේ සිටම පැවතුණි. කලට වැසි වැසීම රජවරුන්ගේ මූලික වගකීමක් වූ අතර ඒ සඳහා කළයුතු පිළිවෙත් සිදුකිරීම නිසිකලට සිදුවුණි. මුල් කාලයේ දී විවිධ පෙරහර වර්ග දෙවියන් මූලික කොට ගනිමින් සිදුකොට තිබේ. දිය කැපීම මගින් සංකේතවත් කෙරෙනුයේ නිසි කලට වැසි ලබාගැනීම විය හැකි ය. රජවරුන් විසින් සිය බල පරාක්‍රමය පෙන්වීම සඳහා ද පෙරහර පවත්වා තිබේ. මෙහි දී ආගමික පරමාර්ථයට වඩා දේශපාලනික පරමාර්ථයන් පෙරහර පැවැත්වීමේ අරමුණ වශයෙන් අන්තර්ගතව පවතියි. ආගමික පරමාර්ථයෙන් පෙරහර පැවැත්වීම ද අතීතයේ පටන් පැවත තිබේ. ඒ අනුව ආගම සම්බන්ධ විවිධ භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම උදෙසා පෙරහර පවත්වා තිබේ. උදාහරණ වශයෙන් සධාතුක කරඬුව ප්‍රදර්ශනය කරමින් පෙරහර පැවැත්වීම දැක්විය හැකි ය. මෙහි දී එකී සමාජයන් හි ජීවත්වන මිනිසුන්ගේ ශ්‍රද්ධාව ජනනය පිණිස අභිප්‍රේරණයක් ලෙස පෙරහර භාවිතයට ගෙන තිබේ. අනෙක් අතට පෙරහරක් නැරඹීමට ඕනෑම සමාජ ස්ථරයකට අවස්ථාව ලබා දී තිබේ. පෙරහර වීථි සංචාරය කිරීමේ එක් අරමුණක්ව ඇත්තේ එයයි. මෙවැනි විවිධ පරමාර්ථයන් පෙරහරක් පැවැත්වීමේ මූලික අරමුණු අතර පවතියි (සම්මුඛ සාකච්ඡාව මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා සමග). පෙරහර අවසාන වශයෙන් සංස්කෘතිය නියෝජනය කරන අංගයක් බවට පත්ව තිබේ. එය අතීතයේ පටන්ම සංස්කෘතිය පවරා දීමේ සජීව ක්‍රියාවලියක් ලෙසින් ක්‍රියාත්මකව තිබේ.

නූතනය වනවිට ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන පෙරහර කිහිපයක් හඳුනාගත හැකි අතර ඒවා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් පවත්වනු ලැබේ. එම පෙරහර අතර හුණුපිටිය ගංගාරාමයේ නවම් මහා පෙරහරට වැදගත් ස්ථානයක් හිමිවෙයි. ඒ අනුව හුණුපිටිය ගංගාරාම විහාරයේ නවම් මහා පෙරහර පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් සිදුකෙරෙනු ඇත.

## ක්‍රමවේදය

මෙහි දී භාවිත ක්‍රමවේද කිහිපයකි. මූලික වශයෙන් ඓතිහාසික මූලාශ්‍රයය අධ්‍යයනය කරනු ලැබූ අතර පෙරහර විකාශයේ ඉතිහාසය විමසීම සඳහා එය

භාවිතයට ගන්නා ලදී. හුණුපිටිය ගංගාරාමයේ නවම් මහා පෙරහර පිළිබඳව ලියවී තිබෙන ඓතිහාසික මූලාශ්‍රයයන් හිඟකම මෙහි බොහෝ තොරතුරු ලබාගැනීම සඳහා බාධාවක් විය. එය මග හැරගනු ලැබුවේ නූතනයේ දී මෙම පෙරහර කටයුතු සඳහා මූලිකත්වය දෙනු ලබන පිරිස් කිහිපයක් සමග සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවන් මගිනි. එමෙන්ම 2014 වර්ෂයේ පෙරහර නිරීක්ෂණය සිදු වූ අතර අන්තර්ජාලය ඔස්සේ ලබාගත් තොරතුරු ඔස්සේ ද මෙම අධ්‍යයනය සිදුකරන ලදී.

## ප්‍රතිඵල

පෙරහර ආරම්භවන දිනට ප්‍රථම දින ගංගාරාම විහාරස්ථානයෙහි බෝධීන් වහන්සේට සිවුරක් පූජා කරමින් පැවැත්වෙන විශේෂ බෝධි පූජාව මෙම පෙරහර ආරම්භයට ප්‍රවේශයක් වශයෙන් සිදුකරනු ලබයි. එහි දී මෙම පෙරහර සාර්ථකව පවත්වා ගැනීම සඳහා රත්නත්‍රයේ පිහිටාරක්ෂාවත් සම්‍යක් දෙවිවරුන්ගේ දේවාශිර්වාදයත් ඉල්ලා සිටිනු ලැබේ. පෙරහර පැවැත්වීම හේතුවෙන් සති පිරිත් දේශනාවක් පැවැත්වීම ද සිදුවන අතර එහිදී සියලුදෙනාට යහපත ප්‍රාර්ථනා කරනු ලැබේ.

කසකරුවන්, ගිනිබෝල කරුවන්, විවිධ කොඩි රැගෙන යන්නන්, විවිධ නැටුම් වර්ග සහ සධාතුක කරඬුව යන අංගයන්ගෙන් ආගමික අර්ථයෙන් පවත්වනු ලබන පෙරහරක් සාමාන්‍යයෙන් සමන්විත ය. ඒ අනුව මෙම සංයුතියට යටත් වෙමින් විවිධ සංස්කෘතිකාංගයන්ගෙන් ගංගාරාම නවම් පෙරහර සමන්විතව පවතියි ( සම්මුඛ සාකච්ඡා ආචාර්ය ගලබොඩ ඥානිස්සර නායක හිමි සමග).

## සාකච්ඡාව සහ සමාලෝචනය

අගනුවර කේන්ද්‍රකර ගත් පෙරහර අතර කොළඹ පෙරහර නමින් ප්‍රසිද්ධ ගංගාරාමයේ නවම් මහා පෙරහර 1979 වර්ෂයේ සිට අඛණ්ඩව මේ දක්වා වාර්ෂිකව පවත්වනු ලැබේ. එය ශ්‍රී ලාංකේය අනන්‍යතාව ප්‍රකට කරන සුවිශේෂ සංස්කෘතිකාංගයක් ලෙස හඳුනාගත හැකි ය. එක් අතෙකින් එය ශ්‍රී ලාංකේය සංස්කෘතියේ විවිධ කලා සම්ප්‍රදායයන් ආරක්ෂා කරමින් එය අනාගත පරපුර උදෙසා රැගෙන යාමට තැනූ වේදිකාවක් බඳු ය. නූතන සංකීර්ණ සමාජ රටාවන් හමුවේ ක්ෂය වී යන සාම්ප්‍රදායික කලා කෞශල්‍යයන් රැක ගැනීමටත් එම කලා පරම්පරාවන් ආරක්ෂා කිරීමටත් මෙම නවම් මහා පෙරහර මගින් මහත් වූ පිටිබලයක් ලබාදෙයි. මෙම පෙරහර සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් නර්තන කණ්ඩායම් සහ අලි ඇතුන් සහභාගිවීම දැකිය හැකි ය. ආරම්භයේ සිට අද දක්වාම අඛණ්ඩව නර්තනයෙහි යෙදෙන නර්තන පරම්පරා කිහිපයක් මෙම පෙරහරෙහි දැකිය හැකිවීම විශේෂත්වයකි. විශේෂයෙන් ම පරම්පරා තුනක් නියෝජනය කරමින් නර්තනයෙහි යෙදෙන නර්තන ශිල්පීන් මෙහි දැකිය හැකි ය.

මෙම පෙරහරෙහි විවිධ නර්තනාංගයන් දැකිය හැකි ය. මෙම නර්තනාංගයන් විවිධ වාද්‍ය වෘන්දයන්ට අනුව ඉදිරිපත් කළ ද සමස්ත පෙරහරෙහි ම රිද්මය එකාකාරීව පවත්වා ගැනීම දැකිය හැකි ය. විශේෂයෙන් ම එකම රිද්මයක් මෙහි දක්නට ලැබෙන අතර එය විලම්භ,මධ්‍ය සහ දෘත යන ලය වේගයන්ගෙන් ගුණ කිරීම පමණක් දැකිය හැකිය. එය පෙරහර ඉදිරියට ගමන් කිරීම සන්නිවේදනය පහසු කරවන්නක් ලෙස ද හඳුනාගත හැකි ය.

මෙම පෙරහර රාත්‍රියක් පුරා වීථි සංචාරය කෙරේ. අතිවිශාල ජනකායක් මෙය නැරඹීමට පැමිණෙති. මෙම කාලය පුරාම නර්තන ශිල්පීන් නර්තනයෙහි යෙදෙන අතර විවිධ වයස් ප්‍රමාණයන් හි නර්තන ශිල්පීන් මෙහි දී නර්තනයෙහි යෙදීම විශේෂත්වයකි. එහෙත් මෙහි නර්තනයෙහි යෙදෙන සියලු පිරිස් කිසිදු වෙහෙස මහන්සියකින් තොරව තුණුරුවන් කෙරෙහි මහත් වූ භක්තියෙන් මෙම පෙරහරෙහි දී සිය දක්ෂතා පෙන්නුම් කරති. පෙරහරක නර්තනයේ යෙදීම ඔවුනට අභිමානයකි. එය සවිඥානකව හෝ අවිඥානකව ඔවුන් තුළ පවතියි. එබැවින් මුලු පෙරහර පුරා ඉතා ඕනෑකමින් නර්තනයේ යෙදීම විශේෂ ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකි ය.

මෙම පෙරහර දෙස් විදෙස් ජනතා ආකර්ශනය ලබාගත් පෙරහරකි. එබැවින් කොළඹ කේන්ද්‍ර කරගත් සංචාරක කර්මාන්තය හා මෙය යම් ආකාරයකට බැඳී පවතියි. ශ්‍රී ලංකාව පිළිබඳ ගැඹුරු පණිවිඩයක් ලෝකයට ලබාදීමට මෙමගින් හැකියාව ලැබී තිබේ. වර්තමානය වනවිට නූතන තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ලෝකයේ කොතැනක සිටියත් මෙම පෙරහර අනතර් ජාලය ඔස්සේ සජීවීව නැරඹීමට හැකියාව ලැබී ඇති බැවින් ශ්‍රී ලාංකේය උරුමය පිළිබඳ යහපත් සන්නිවේදනයක් කළ හැකි ජාතික උත්සවයක් ලෙස හුණුපිටිය ගංගාරාම නවම් මහා පෙරහර හඳුනාගත හැකි ය. ඒ අනුව පෙරහර සහ උරුමය ආරක්ෂා කිරීම සම්බන්ධවත්, එය මතු පරම්පරාව කෙරෙහි රැගෙන යාමට සිදුකරනු ලබන මෙහෙයත් අතිශය අගය කළ යුතු මට්ටමක පවතියි.

මෙම පෙරහරට දායකත්වය ලබාදෙන පිරිස් පිළිබඳව සැලකීමේ දී බෞද්ධ අබෞද්ධ ගිහි පින්වතුන් ඒ සඳහා පෙළ ගැසීම දැකිය හැකිය. ගංගාරාම විහාරස්ථානය කේන්ද්‍රකොට ගත් ශ්‍රී ජිනරතන කාර්මික විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් මෙම පෙරහර සංවිධානය කිරීමට ඉමහත් කැපවීමෙන් කටයුතු කරනු ලැබේ. තරුණ පරපුර සිය රටෙහි උරුමය ආරක්ෂා කිරීමට මහත් වූ අභිමානයෙනුත් කැපවීමෙනුත් සම්බන්ධවන අවස්ථාවක් වශයෙන් මෙම පෙරහර හඳුනාගත හැකි ය. මේ සා විශාල වැඩ කොටසක් ඉටු කරනු ලබන මෙම පෙරහරට අනුශාසකත්වය ලබාදෙන කොළඹ නව කෝරළයේ ප්‍රධාන සංඝනායක ආචාර්ය ගල්බොඩ ශ්‍රී ඥාණිස්සර ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේලාගේ කැපවීම ද මෙම පෙරහර මගින් පෙන්නුම් කරනු ලැබේ.

ශ්‍රී ලංකාව බහු වාර්ගික පදනමක් පෙන්නුම් කරන සමාජයකි. මෙම පෙරහර සංවිධානය කිරීම සඳහා ගංගාරාම විහාරස්ථානය අවට සිටින ජනතාව කිසිදු භේදයකින් තොරව සක්‍රීයව දායකවීම දැකිය හැකි ය. එය ජාතියේ සමගියත්, එකමුතුබවත් පෙන්නුම් කරන සක්‍රීය ක්‍රියාවලියක් ලෙස හඳුනාගත හැකි ය. එබැවින් කොළඹ පෙරහර හෙවත් හුණුපිටිය ගංගාරාමයේ නවම් මහා පෙරහර ජාතික අනන්‍යතාවකින් යුක්ත ආගමික සහ සංස්කෘතික මංගල්‍යයක් ලෙස හැඳින්වීම යුක්ති යුක්ත ය.

**ප්‍රමුඛ පදඃ** නවම් මහා පෙරහර, සංස්කෘතිය, උරුමය

**කෙටියෙදුම්** මව (මහාවංශය) සිබෝව (සිංහලබෝධිවංශය) සිධාව (සිංහලධාතුවංශය) සුශ (සුමංගලශබ්දකෝෂය)

**ආශ්‍රිත ග්‍රන්ථ**


**මහාවංශය.** (සංස්). (2009). දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**සිංහල බෝධිවංශය.** සේනාධීර, ගුණපාල. (සංස්). (1970). ගල්කිස්සඃ අභය ප්‍රකාශකයෝ.

**සිංහල ධාතුවංශය.** විජේරත්න, විමල්. (සංස්). (2012). කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

සෝරත හිමි, වැලිවිටියේ. (2006). *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.* කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

වජිර හිමි, කුඹුරුගමුවේ. (1983). *දළදා ඉතිහාසය හා සංස්කෘතිය.* කැලණිය : විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.


BHIKSHU UNIVERSITY OF S
07 APR 2015
LIBRARY